**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**නිවාඩු කාලීන පැවරුම්**

**සිංහල 9 - ශ්‍රේණිය**

**නිවිතිගල අධ්‍යාපන කලාපය**

## මාර්තු 1 සතිය

## 4 පාඩම -ස්ටීවන් හෝකින්

1. හිස්තැන් පුරවන්න.

- සිංහල අක්ෂර මාලාවේ අක්ෂර ..........ක් ඇත.
- අක්ෂර මාලාව .........හා .......... යනුවෙන් කොටස් දෙකකට බෙදේ.
- අක්ෂර මාලාවේ ස්වර ........කි.
- ව්‍යඤ්ජන අක්ෂර ............ව උච්චාරණය කළ නොහැකි ය.
- අක්ෂර මාලාවේ ............. අක්ෂර 42ක් ඇත.

( ප්‍රාණාක්ෂර,තනි,60, ව්‍යඤ්ජන,ගාත්‍රාක්ෂර,18)

2. උදාහරණ තේරුම් ගෙන පහත සඳහන් ආකාරවල ස්වර හා ව්‍යඤ්ජන වෙන් කරන්න.

උදා - ගa = ග් + සa

✍ කෙ ✍ ගaa

✍ තෛ ✍ කූ

✍ බු ✍ රැ

✍ සො ✍ බි

✍ ම ✍ සෞ

3. මෙම වාක්‍යවල සත්‍ය අසත්‍ය භාවය වරහන් තුළ යොදන්න.

- 🕮 ශබ්ද උච්චාරණයේ දී චලනය නොවන මුඛ උපාංග අක්ෂර උත්පත්ති ස්ථාන ලෙස හැඳින්වේ. (.......)
- 🕮 (අ)ං හා (අ)ඃ යනු ස්වර අක්ෂර අක්ෂර යි. (.......)
- 🕮 වෙනත් අක්ෂරයක උපකාරයකින් තොර ව ශබ්ද කළ හැක්කේ ව්‍යඤ්ජන අක්ෂර යි. (.......)
- 🕮 'ගම' යන වචනය සෑදී ඇත්තේ කණ්ඨජ හා ඕෂ්ඨජ අක්ෂරවලිනි. (.......)
- 🕮 'ජ' යනු ඕෂ්ඨජ අක්ෂරයකි. (.......)


4. දන්තජ අක්ෂර වලින් ආරම්භ වන වචන 5ක් ලියන්න.

උදා - තෝඩු

5. මෙම අක්ෂර වල උත්පත්ති ස්ථාන නම් කරන්න.

ජ , ණ , හ , හ , ග

6. මෙම රූප සටහනෙහි අක්ෂර උත්පත්ති ස්ථාන නම් කරන්න.



● ..........................................

● ..........................................

● ..........................................

● ..........................................

● ..........................................

7. රචනය - මම පොල් ගසක් වෙමි.